# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1973/28 - 2016 ජුනි මස 29 වැනි බදාදා - 2016.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XII)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වනු ලබන්නා වූ සහ (2016 අප්‍රේල් මස 26 වැනි දින සහ අංක 1964/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත වූ) 1996 මාර්තු මස 27 වැනි දින අංක 916/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදනු ලැබුවා වූ නියමයේ උපලේඛනය එකී උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති ''ඉංජිනේරු පීඨය'' යන අයිතමයට හා එකී උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහන්වලට ඉක්බිතිව ම, පහත දැක්වෙන අයිතමය සහ සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| *“I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| තාක්ෂණ පීඨය | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයන අංශය |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය''. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-635


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 2992 — 508 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*